ශීර්ෂය 20 - මැතිවරණ කොමිෂන් සභාව
------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 තත්ත්වාගණනය නොකළ මතය

මැතිවරණ කොමිෂන් සභාවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව මැතිවරණ කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 28 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 24 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට මැතිවරණ කොමිෂන් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය නොකළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ

නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරනගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලකිලිමත් විය යුතුය.
වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මග හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස කොමිෂන් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳ ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (ඇ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මැතිවරණ කොමිෂන් සභාව විසින් ඉකුත් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවක් නොතිබුණු බැවින් , සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව ප්‍රකාශ කළ නොහැකි විය.

(ආ) මැතිවරණ කොමිෂන් සභාව විසින් ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව නිර්දේශ ඉදිරිපත් කර නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවීම

2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුව තිබුණත් එම අවශ්‍යතාවන්ගෙන් බැහැර වූ අවස්ථා පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේදී එම වත්කම්වලට අදාළ ප්‍රධාන ලෙජර් ශේෂ වටිනාකම සමඟ කේවල වත්කම් වටිනාකම් පරීක්ෂාකර බලා එම වටිනාකම් සසඳා නොතිබුණි. | ඉහත චක්‍රලේඛයේ 3.3 ඡේදය ප්‍රකාරව මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේදී එම වත්කම්වලට අදාළ ප්‍රධාන ලෙජර් ශේෂ වටිනාකම සමඟ කේවල වත්කම් වටිනාකම් පරීක්ෂාකර බලා එම වටිනාකම් සැසඳෙන බව තහවුරු කර ගත යුතු වීම. | නිරීක්ෂණය සමඟ එකඟ වෙමි. 2019 වර්ෂයේ දී ගැලපීමට කටයුතු කරමි. |
| (ආ) | ආයතනය විසින් විගණනයට ඉදිරිපත් කර තිබුණු මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ ශුද්ධ වත්කම් ලෙස , දේපළ පිරියත උපකරණ වල වටිනාකම දක්වා තිබුණි. | ඉහත චක්‍රලේඛයේ 7(V) ඡේදය ප්‍රකාරව මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ශුද්ධ වත්කම් ගණනය කරනුයේ කොමිෂන් සභාව සතු අත්තිකාරම් ගිණුම් වටිනාකම්වලින් තැන්පතු ගිණුම් වටිනාකම් අඩු කිරීමෙනි. | - එම - |

### 1.6.2 මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | 2018 වර්ෂයේ මඩකලපුව දිස්ත්‍රික් නව නිල නිවාස ඉදිකිරීම අවසන් කර නොමැති අතර ඒ වෙනුවෙන් වැය කරන ලද රු.3,949,288 ක වටිනාකම ගොඩනැගිලි සහ ඉදි කිරීම් යටතේ 2018 දෙසැම්බර් 31 දිනට ප්‍රාග්ධනිත කර අවසන් මූල්‍ය ප්‍රකාශන තුල දක්වා තිබුණි. | ඉදි කිරීම් අවසන් කර නොමැති මඩකලපුව දිස්ත්‍රික් නව නිල නිවාස වෙනුවෙන් වැය කරන ලද රු.3,949,288 ක වටිනාකම මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයේ කෙරීගෙන යන වැඩ තිරුවේ සටහන් කල යුතුය. | නිරීක්ෂණය සමඟ එකඟ වෙමි. නිවැරදි කිරීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (ii) | සමාලෝචිත වර්ෂයේ අපහරණය කරන ලද වාහන 02 ක පිරිවැය වූ රු.2,953,281 ක වටිනාකම වාහන වල පිරිවැයෙන් ඉවත් කළ යුතු වුවත් එම වාහන වල විකුණුම් වටිනාකම අපහරණ යටතේ දක්වා තිබුණි. | අපහරණය කරන ලද වාහනවල පිරිවැය වාහන වටිනාකමින් ඉවත් කළ යුතු වීම. | - එම - |
| (iii) | සමාලෝචිත වර්ෂයේ වාහනයක් අපහරණය කර තිබුණු අතර එහි රු.7,500,000 ක පිරිවැය පිළිබඳ කිසිදු සටහනක් 2018 මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ සටහන් කර නොතිබුණි. | අපහරණය කර , ඉවත් කරන ලද වාහනවල පිරිවැය මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ වාහන පිරිවැයෙන් ඉවත් කළ යුතු වීම. | - එම - |
| (iv) | සමාලෝචිත වර්ෂයේදී දිස්ත්‍රික් කාර්යාල විසින් අපහරණය කරන ලද කාර්යාලීය උපකරණ සහ යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණවල පිරිවැය රු.4,369,874 ක් මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ අපහරණ යටතේ දක්වා නොතිබුණි. | සමාලෝචිත වර්ෂයේ දී ආයතනය විසින් අපහරණය කරන ලද මුළු වත්කම්වල පිරිවැය මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ අපහරණ යටතේ දැක්විය යුතු වීම. | - එම - |

**1.6.3 විගණන සාක්ෂි නොවීම**

**---------------------------**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| <u>විගණන නිරීක්ෂණය</u> | <u>නිර්දේශය</u> | <u>ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම</u> |
|---|---|---|
| 2018 පළාත් පාලන ආයතන ඡන්ද විමසීමට අදාලව මහනුවර දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ කුලී පදනම මත ලබා ගත් වාහන සඳහා රු.1,631,617 ක ගනුදෙනුවලට අදාල ප්‍රවාහන කමිටු තොරතුරු | ඡන්ද විමසීම අවසන් වීමෙන් පසුව ප්‍රවාහන කමිටු තොරතුරු මහනුවර දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය වෙත භාර දිය යුතු වීම. | ප්‍රවාහන කමිටුව විසින් දන්වා ඇති පරිදි සේවයේ යොදවා ගන්නා ලදැයි සඳහන් වාහන ප්‍රමාණයට වඩා අඩු වාහන සංඛ්‍යාවකට ගෙවීම් කර ඇති අතර අදාළ වාර්තාව ලබා දෙන ලෙස ප්‍රවාහන කමිටුව වෙත දන්වා |

| | | | |
|---|---|---|---|
| කාර්යාලයට භාරදී නොතිබීම හේතුවෙන් එය විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කළ නොහැකි විය. | | ඇත. | |

**1.6.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

**-------------------------------------------------------**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නිරීක්ෂණය | | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | | |
| (i) **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහ**<br>**xxiv වැනි පරිච්ඡේදයේ 4.4 ඡේදය** | 2018 ජනවාරි 03 වන දින මියගිය නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු.158,030 ක මුදල නිරවුල් කිරීමට 2019 මාර්තු 05 දින වන විටත් කටයුතු කර නොතිබුණි. | මියගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු ණය ශේෂ නිරවුල් කිරීමට ආයතනය කටයුතු කල යුතු වේ. | මරණ පාරිතෝෂිකය ගෙවන අවස්ථාවකදී අය කර ගැනීමට සටහන් කර ගන්නා ලදී.ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. |
| (ii) **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය**<br>මුදල් රෙගුලාසි 106 | සමාලෝචිත වර්ෂය තුළ කොමිෂන් සභාවේ ඉන්ධන ඇණවුම් පොත් 25 ක් අස්ථාන ගත වීම සම්බන්ධව මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 106 ප්‍රකාරව ඌනතාවක් අයථා පරිහරණයක් හෝ වෙනත් කරුණක් නිසා නැති වූ විටෙක ඒ නැති වූ භාණ්ඩ වල වටිනාකම වහාම පූර්ණය කළ යුතු වීම. | නිරීක්ෂණය හා එකඟ වෙමි. මූලික පරීක්ෂණ වාර්තාව ලැබී ඇත. ඒ අනුව ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. |
| (iii) මුදල් රෙගුලාසි 104 (4) | 2018 නොවැම්බර් 23 දින කැබ් රථයකට සිදු වූ ආලාභය පිළිබඳ මුදල් රෙගුලාසි ප්‍රකාරව එම හානිය සම්බන්ධයෙන් පූර්ණ වාර්තාවක් පිළියෙල කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරන අවස්ථාවේදී වාහනයේ අලාභය තක්සේරු කර නොතිබීම හේතුවෙන් ඇතුලත් නොකරන ලදි. 2019 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. |

| | | | | |
|---|---|---|---|---|
| (iv) | මුදල් රෙගුලාසි 137 (3) හා (4) | මුදල් රෙගුලාසි ප්‍රකාරව ගෙවීම් කිරීමේදී ගිවිසුමේ සඳහන් නියමයන්ට අනුව කටයුතු කළ යුතු වුවත් ගිවිසුම්ගත කොන්ත්‍රාත් මිල වන රු.721,215 ඉක්මවා රු.130,936ක් ගෙවා තිබුණි. | මුදල් රෙගුලාසි 137 (3) හා (4) පරිදි ගිවිසුම් ප්‍රකාරව ගෙවීම අනුමත කිරීම සිදු කළ යුතු වීම. | කොන්ත්‍රාත්තුව සඳහා සකස් කළ ඇස්තමේන්තුව සලකාබලා ගෙවීම් කර ඇත.ඉදිරි කොන්ත්‍රාත් කටයුතු වලදී මෙවැනි විචලනයන් සඳහා ප්‍රසම්පාදන කමිටු අනුමැතිය ලබා ගැනීමට උපදෙස් ලබා දී ඇත. |
| (v) | මුදල් රෙගුලාසි 104 | සමාලෝචිත වර්ෂයේදී මහනුවර දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ අස්ථාන ගත වී තිබුණු රු.59,220 ක ආරෝපිත විදුලි බුබුළු 56 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව සිදුවූ පාඩුවේ ප්‍රමාණය හා හේතු නිශ්චිත වශයෙන් දැන ගැනිමට පරික්ෂණයක් පවත්වා පූර්ණ වාර්තාවක් පිළියෙල කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | මහනුවර දිස්ත්‍රික් මැතිවරණ කොමසාරිස් වරයාට අස්ථානගත වූ විදුලි බුබුළු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කිරීමට උපදෙස් ලබා දී ඇත. පරීක්ෂණ වාර්තාව අනුව කටයුතු කරනු ලැබේ. |
| (vi) | මුදල් රෙගුලාසි 264 | ආයතනය විසින් රු.1,009,656 ක් වටිනා ගණුදෙනු 06 ක් සඳහා ගෙවීම් සිදු කිරීමේදී වවුචරයේ සඳහන් දළ මුදල ලැබුණු බවට ආදායකයාගෙන් ලබා ගත්, අවශ්‍ය විට නිසි පරිදි මුද්දර යෙදූ කුවිතාන්සි මඟින් තහවුරු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 264 ප්‍රකාරව සෑම ගෙවීමක්ම වවුචරයේ සඳහන් දළ මුදල ලැබුණු බවට ආදායකයාගෙන් අවශ්‍ය විට නිසි පරිදි මුද්දර යෙදූ කුවිතාන්සියකින් තහවුරු විය යුතු වීම. | නිරීක්ෂණය හා එකඟ වෙමි.කුවිතාන්සි පසුව ලබා ගැනීමට කටයුතු කරනු ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| (vii) | මුදල් රෙගුලාසි 177(1) | කොළඹ නාගරික හා දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල විසින් දෛනිකව ලැබෙන මුදල් දෛනිකව බැංකුගත කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 177(1) ප්‍රකාරව රජයේ අදායමේ කොටසක් වශයෙන් හෝ නොඑසේම හෝ තම තමන්ට ලැබෙන මුළු මුදලම දිනපතා හෝ හැකිතාක් කලින් හෝ ප්‍රේෂණය කොට එම මුදල ට කුවිතාන්සි ලබා ගැනිම රජය වෙනුවෙන් කවර මුදලක් වුවද ලබන සියලුම එකතු කරන නිලධාරින් ගේ රාජකාරිය වේ. | පළාත් පාලන ආයතන ඡන්ද විමසීමට අදාළ රජකාරි බහුල වීම හා අදාල නිලධාරියා නිවාඩු ලබා තිබුණු අවස්ථාවලදී බැංකුගත කිරීමේ ප්‍රමාදයක් සිදුව ඇත.නිවැරදි කිරීමට උපදෙස් දී ඇත. |
| (viii) | රාජ්‍ය මුදල් චක්‍රලේඛ | | | |
| | **2015 ජුලි 10 දිනැති අංක 02/2015 දරන චක්‍රලේඛයේ 9 (අ) ඡේදය** | තීරුබදු රහිතව ආනයනය කරන ලද වාහනයක් අපහරණය කිරීමේදී එම තීරුබදු කොන්දේසි නිසි පරිදි අවලංගු කර ගැනිමෙන් තොරව අපහරණය සඳහා කටයුතු කර තිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව තීරුබදු කොන්දේසි නිසි පරිදි අවලංගු කර ගැනීමෙන් අනතුරුව පමණක් අදාල වාහන අපහරණ ක්‍රියාවලියට ඇතුලත් කළ යුතු වීම. | අපහරණ ක්‍රියාලිය ආරම්භ කිරීමට පෙර මේ පිළිබදව පැහැදිලි අවබෝධයක් නොතිබුණි. 2019 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. |
| (ix) | පළාත් පාලන ආයතන ඡන්ද විමසීමේ ආඥාපනත | 2018 පළාත් පාලන ආයතන ඡන්ද විමසීමේදී ප්‍රාදේශීය සභා 18 කට අදාලව අපේක්ෂකයින් තැන්පත් කරන ලද රු.934,500 ක ඇප මුදල් නිදහස් කර නොතිබුණි. | පළාත් පාලන ආයතන ඡන්දය විමසිමේ ආඥාපනතේ (262 වන අධිකාරය ) (4) 29 වන වගන්තිය ප්‍රකාරව අපේක්ෂකයෙකු තරග කළ කොට්ඨාශයේ ගනු ලබන මුළු වලංගු ඡන්ද සංඛ්‍යාවෙන් විස්සෙන් එක ඉක්මවන අවස්ථාවලදී එම අපේක්ෂකයා වෙත ඒ මුදල ඡන්ද විමසිමේ ප්‍රතිඵල ප්‍රකාශ කරනු ලැබීමෙන් පසු හැකි ඉක්මනින් ආපසු ලබා | 2018 දෙසැම්බර් 07 දිනට පෙර ඇප තැන්පතු මුදල් නිදහස් කිරීමට ඉල්ලුම් නොකරන අපේක්ෂකයින්ගේ ඇප මුදල් රජයේ ආදායමට බැර කරන බව අපේක්ෂකයින්ට 2018 නොවැම්බර් 29 දින දන්වා ඇත.වසර 02 අවසන් වූ පසු රජයේ ආදායමට ගැනීමට කටයුතු කරනු ලැබේ. |

| | | | |
|---|---|---|---|
| | | දිය යුතු වීම. | |

(x) අභ්‍යන්තර චක්‍රලේඛ

-----------------------

| | | | |
|---|---|---|---|
| 2017 නොවැම්බර් 21 දින නිකුත් කරන ලද අංක S/7(1) දරන අභ්‍යන්තර චක්‍ර ලේඛය | මහනුවර දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය විසින් රු.මිලියන 2.69 ක් වටිනා ආරෝපිත විදුලි බුබුළු 2540ක් මිලදී ගැනීමේදී නිසි අධිකාරී බලය ලබා ගෙන නොතිබුණි. | ප්‍රසම්පාදනය රු.මිලියන 1.5 ඉක්මවන අවස්ථාවේදී කොමිෂන් සභා ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය ලබා ගත යුතු වේ. | ප්‍රධාන කාර්යාලයෙන් ලබා දී ඇති උපදෙස් හා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව කටයුතු නොකිරීම සම්බන්ධයෙන් අදාල නිලධාරියාගෙන් හේතු විමසා ඇත. ඉදිරියේදී නිවැරදිව කටයුතු කිරීමට උපදෙස් ලබා දී ඇත. |

**2.** මූල්‍ය සමාලෝචනය

-----------------------

**2.1** වියදම් කළමනාකරණය

-------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| <u>විගණන නිරීක්ෂණය</u> | | <u>නිර්දේශය</u> | <u>ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම</u> |
|---|---|---|---|
| (අ) | පුනරාවර්ථන වැය විෂයන් 07 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම නිසා එම වැය විෂයයන්වල ප්‍රතිපාදන උපයෝජනය කළ පසු ඉතිරිය සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 15 ක සිට සියයට 37 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි. | මුදල් රෙගුලාසි 50 හි සඳහන් විධිවිධාන ඉටුවන පරිදි වාර්ෂික වියදම් ඇස්තමේන්තු ප්‍රකාරව වියදම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වේ. | හැකිතාක් දුරට මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව වියදම් ඇස්තමේන්තු පිළියෙල කරන ලදි.නිරීක්ෂණය පිළිගනිමි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | මූලධන වැය විෂයන් 2ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම නිසා එම වැය විෂයයන්වල ප්‍රතිපාදන උපයෝජනය කළ පසු ඉතිරිය සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 92 ක සිට සියයට 94 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි. | මුදල් රෙගුලාසි 50 හි සඳහන් විධිවිධාන ඉටුවන පරිදි වාර්ෂික වියදම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වේ. | හැකිතාක් දුරට මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව වියදම් ඇස්තමේන්තු පිළියෙල කරන ලදි. නිරීක්ෂණය පිළිගනිමි. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

----------------------------

**3.1 සැලැසුම් කිරීම**

-----------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| <u>විගණන නිරීක්ෂණය</u> | <u>නිර්දේශය</u> | <u>ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම</u> |
|---|---|---|
| 2014 පෙබරවාරි 17 දිනැති අංක 2014/01 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව කොමිෂන් සභාව විසින් විගණනයට ඉදිරිපත් කරන ලද 2018 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම තුල වර්ෂයට අදාල යාවත්කාලීන කළ ආයතනයේ සංවිධාන ව්‍යුහය, අනුමත කාර්ය මණ්ඩලය හා දැනට සේවයේ සිටින කාර්ය මණ්ඩලය , වාර්ෂික අක්අමුදල් අවශ්‍යතා සැලැස්ම, වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සහ අභ්‍යන්තර විගණන සැලැස්ම අන්තර්ගත වී නොතිබුණි. | 2014 පෙබරවාරි 17 දිනැති අංක 2014/01 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | 2019 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. |

**3.2 කාර්යභාරයන් ඉටු නොකිරීම**

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) කොමිෂන් සභාවේ පාලන අංශය විසින් රත්නපුර දිස්ත්‍රික්ක මැතිවරණ කාර්යාලයේ බිත්ති කබඩ් සවිකිරීම සහ ඇලුමිනියම් කොටස් යොදා පාටිෂන් කිරීම සැලසුම් කර ඇතත් එම කාර්යයන් ඉටු කර නොතිබුණි. | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව කටයුතු කළ යුතු වීම. | සමාලෝචිත වර්ෂයේ දී ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට අත්තිකාරම් ගෙවීමට මුදල් නොමැති වීම හේතුවෙන් මෙම කාර්ය 2019 වර්ෂයට ගෙන යන ලදී. |
| (ආ) කොමිෂන් සභාවේ අභ්‍යන්තර විගණන අංශය විසින් ඉටු කළ යුතු කාර්යයන් 06ක් ඉටු කර නොතිබුණි. | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව කටයුතු කළ යුතු වීම. | ප්‍රධාන කාර්යන් 02කට අදාල අනුකාර්යයන් 06ක් පමණක් ඉටු කර නොමැති අතර වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ ප්‍රගති වාර්තාවට තොරතුරු ඇතුළත් කිරීමේ දෝෂයක් හේතුවෙන් මෙලෙස වාර්තා වී ඇත.ඉදිරි වර්ෂයේදී ප්‍රගති වාර්තාව නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. |

**3.3 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම**

-----------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) කොමිෂන් සභාවේ තොරතුරු තාක්ෂණ අංශය විසින් ඉටු කළ යුතු කාර්යයන් 3ක් සමාලෝචිත වර්ෂය තුල ඉටු කළ ද ඒවා අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොතිබුණි. | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව කටයුතු කළ යුතු වීම. | එක් කාර්යයක් කොමිෂන් සභාවේ උපදෙස් මත තාවකාලිකව නවතා ඇත.අනෙකුත් කාර්යන් කඩිනමින් ඉටු කිරීමට උපදෙස් ලබා දී ඇත. |
| (ආ) කොමිෂන් සභාවේ ප්‍රසම්පාදන | - එම - | කාර්යන් 02ක් සඳහා සමාලෝචිත වර්ෂයේ දී |

| | |
|---|---|
| අංශය විසින් ඉටු කළ යුතු කාර්යන් 3 ක් සමාලෝචිත වර්ෂය තුල ඉටු කළ ද ඒවා අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොතිබුණි. | ප්‍රමාණවත් අක්මුදල් නොමැති විම හේතුවෙන් 2019 වර්ෂයට ගෙන යන ලද අතර එක් කාර්යක් කාලය ප්‍රමාණවත් නොවිම හේතුවෙන් 2019 වර්ෂයට ගෙන යන ලදී. |

**3.4** **ව්‍යාපෘති ඉටු කිරිමේ ප්‍රමාදයන්**

**-----------------------------------**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| <u>**විගණන නිරික්ෂණය**</u> | <u>**නිර්දේශය**</u> | <u>**ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම**</u> |
|---|---|---|
| යාපනය දිස්ත්‍රික්කයේ නව කාර්යාල ගොඩනැගිල්ල ඉදි කිරීම සඳහා ඇස්තමේන්තු සකස් කිරීම හා මිලගණන් කැඳවීමේ ගැටළුකාරී තත්ත්වයන් හේතුවෙන් ප්‍රසම්පාදනය අවලංගු කර තිබුණි. මේ හේතුවෙන් ව්‍යාපෘතිය ඉටුකිරීම ප්‍රමාද වී තිබුණි. | සැලසුම් අනුව කටයුතු කළ යුතු වීම. | 2019 වර්ෂයේ ආරම්භ කිරීමට නියමිතය. |

**3.5** **කාල පමාවකින් පසුව වැඩ ආරම්භ කළ ව්‍යාපෘති**

**---------------------------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| <u>**විගණන නිරික්ෂණය**</u> | <u>**නිර්දේශය**</u> | <u>**ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම**</u> |
|---|---|---|
| මඩකලපුව දිස්ත්‍රික්කයේ කාර්යාල නිල නිවාසය ඉදි කිරීම සම්බන්ධව නිල නිවසේ සැලැස්ම වරින් වර සංශෝධනය වීම හේතුවෙන් අදාල කාර්යය ප්‍රමාද වී ආරම්භ කර තිබුණි.එම හේතුවෙන් මෙම කාර්ය සමාලෝචිත වර්ෂයේදී අවසන් කිරීමට නොහැකි වී තිබුණි. | සැලසුම් අනුව කටයුතු කළ යුතු වීම. | 2019 වර්ෂයේ දෙවන කාර්තුවේ වැඩ අවසන් කිරීමට නියමිතය. |

**3.6 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම**

**----------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රධාන කාර්යාලයේ ඉදිරිපස වැට මායිම් හා ඇතුළුවීමේ දොරටුව සහ පසුපස වැට මායිම් අළුත්වැඩියාව යන කාර්යයන් 02 ක් සිදු නොකර අතහැර දමා තිබුණි. | සැලසුම් අනුව කටයුතු කළ යුතු වීම. | 2019 වර්ෂයේදී නිම කිරීමට කටයුතු කරනු ඇත. |

**3.7 වාර්ෂික කාර්යසාධන වාර්තාව**

**----------------------------------**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16.2 වගන්තිය ප්‍රකාරව කාර්යසාධනය පරීක්ෂා කිරීම සඳහා 2018 වර්ෂයේ කාර්ය සාධන වාර්තාව විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණි. මේ හේතුවෙන් රු.මිලියන 3,401.89 ක වියදමට අදාල කාර්ය සාධනය පරීක්ෂා කිරීමට නොහැකි විය. | කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කළ යුතු වීම. | කාර්ය සාධන වාර්තාව සකස් කිරීම අවසන් අදියරේ ඇත. |

**3.8** **ප්‍රසම්පාදනයන්**

**-----------------**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | **ගම්පහ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය** | | |
| (i) | ඡන්ද විමසීමේ කාර්ය සඳහා සියනෑ අධ්‍යාපන විද්‍යාපීඨයේ ඉදිකිරීම් කටයුතු වෙනුවෙන් කොන්ත්‍රාත්කරු සමග විධිමත් ගිවිසුමකට එළඹ නොතිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.ජේදය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | නිරීක්ෂණය හා එකඟ වෙමි. නිවැරදිව කටයුතු කිරීමට උපදෙස් ලබා දී ඇත. |
| (ii) | ඡන්ද විමසීමේ කාර්ය සඳහා මේස හා පුටු කුලී පදනම මත ලබා ගැනීමේදී ලංසුකරුවන්ට ලංසු පිළියෙල කිරීමට ප්‍රමාණවත් කාලයක් ලබා දී නොතිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.2.2 ජේදය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | ව්‍යවස්ථාපිත කාර්යයක දී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.2.2 ජේදය ප්‍රකාරව කටයුතු කළ නොහැකි බව දක්වා තිබුණි. නිවැරදිව කටයුතු කිරීමට උපදෙස් ලබා දී ඇත. |
| (iii) | ගම්පහ දිස්ත්‍රික් ඡන්දය ගණන් කිරීමේ ප්‍රධාන ගණන් කිරීමේ මධ්‍යස්ථාන භූමියේ තාවකාලික කුටි ඉදිකිරීමේදී ලංසු ප්‍රධානය කිරීමේ ලිපිය ප්‍රකාරව කාර්ය සම්බන්ධයෙන් ගිවිසුමකට එළඹ නොතිබුණි. | ලංසු ප්‍රදානය කිරීමේ ලිපිය ප්‍රකාරව කාර්යය සම්බන්ධයෙන් ගිවිසුමකට එළැඹිය යුතු වීම. | නිරීක්ෂණය හා එකඟ වෙමි. නිවැරදිව කටයුතු කිරීමට උපදෙස් ලබා දී ඇත. |
| (iv) | ඡන්ද විමසීමේ කාර්ය සඳහා ගොඩනැගිලි අලුත් වැඩියා කිරීමේ දී, එම කාර්යට අදාල මූලික ඇස්තමේන්තුව සඳහා ප්‍රධාන කාර්යාලයෙන් අනුමැතිය ලබා ගෙන නොතිබුණි. | 2017 නොවැම්බර් 21 දිනැති අංක S/7 (1) දරන කොමිෂන් සභාවේ අභ්‍යන්තර චක්‍ර ලේඛයේ 1 ජේදය ප්‍රකාරව ගොඩනැගිලි අලුත් වැඩියා කිරීමේදී මූලික ඇස්තමේන්තුව ප්‍රධාන කාර්යාලයේ අනුමැතිය සඳහා ඉදිරිපත් කළ යුතු වීම. | නිරීක්ෂණය හා එකඟ වෙමි. නිවැරදිව කටයුතු කිරීමට උපදෙස් ලබා දී ඇත. |
| | **මහනුවර දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය** | | |
| (v) | රණබිම රාජකීය විද්‍යාලය අලුත් | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ | නිලධාරීන් කාර්ය බහුල වීම |

| | | | |
|---|---|---|---|
| | වැඩියා කිරීම හා රණබිම රාජකීය විද්‍යාලය අසල හෙක්ටර් කොබ්බෑකඩුව මාර්ගයේ කොටසක් කොන්ක්‍රීට් කිරීමට අදාලව සිදු කරන ලද ප්‍රසම්පාදන කාර්යයේ දී නිසිපරිදි ගිවිසුමකට එළඹ නොතිබුණ අතර ප්‍රසම්පාදන ලිපි ගොනු නිසිපරිදි පවත්වා ගෙන නොතිබුණි. | සංග්‍රහයේ 8.9.ජේදය ප්‍රකාරව විධිමත් ගිවිසුමකට එළැඹිය යුතු වීම. | හේතුවෙන් ලිපිගොනු නිසිපරිදි නඩත්තු කිරීමට නොහැකි විය. නිවැරදිව කටයුතු කිරීමට උපදෙස් ලබා දී ඇත. |
| (vi) | රණබිම රාජකීය විද්‍යාලය අසල හෙක්ටර් කොබ්බෑකඩුව මාර්ගයේ කොටසක් කොන්ක්‍රීට් කිරීමට අදාලව සිදු කරන ලද ප්‍රසම්පාදන කාර්යයේ දී කොන්ත්‍රාත්කරු සමග විමසීම් කර එකග වූ කරුණු සම්බන්ධයෙන් තොරතුරු ලිපි ගොනු තුල නොතිබුණු අතර ඒ සම්බන්ධයෙන් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.12.4 ප්‍රකාරව අවබෝධතා ගිවිසුමක්ද අත්සන් කර නොතිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.12.4 ජේදය ප්‍රකාරව අවබෝධතා ගිවිසුමක් ලියා අත්සන් කළ යුතු වේ. | නිරීක්ෂණය හා එකඟ වෙමි. නිවැරදිව කටයුතු කිරීමට උපදෙස් ලබා දී ඇත. |
| (vii) | විද්‍යාලයක වැසිකිළි පද්ධතිය හා ජල පද්ධතිය අලුත් වැඩියා කිරීමේ කාර්යය සඳහා වෙළඳපොළ මිල සැදැහුම් ක්‍රමය යටතේ ලංසුකරුවන්ට ලංසු ඉදිරිපත් කිරීමට ප්‍රමාණවත් කාලයක් ලබා දී නොතිබුණු අතර කොන්ත්‍රාත්කරු සමග විමසීම් කර එකග වූ කරුණු සම්බන්ධයෙන් අවබෝධතා ගිවිසුමක් ද අත්සන් කර නොතිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.2.2 ජේදය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | නිරීක්ෂණය හා එකග වෙමි. නිවැරදිව කටයුතු කිරීමට උපදෙස් ලබා දී ඇත. |
| (viii) | මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාල පළමු මහලේ කොරිඩෝවේ කාර්යයන් සියල්ලම සිදු කර නොතිබුණු අතර බිත්ති පින්තාරු කිරීමට අදාල කොන්ත්‍රාත් ගිවිසුමට අනුව ප්‍රමාද ගාස්තු අයකර නොතිබුණි. | කොන්ත්‍රාත් ගිවිසුමට අනුව ප්‍රමාද ගාස්තු අයකර ගත යුතු වීම. | ගිවිසුමට අනුව ප්‍රමාද ගාස්තු අයකර ගත යුතු නම් සොයා බලා අයකිරීමට කටයුතු කරනු ලැබේ. නිවැරදිව කටයුතු කිරීමට උපදෙස් ලබා දී ඇත. |

| | | | |
|---|---|---|---|
| (ix) | කොළඹ නාගරික මැතිවරණ කාර්යාලය ඡන්ද කටයුතු සඳහා සහභාගී වන නිලධාරීන්ට ආහාර සැපයීම සඳහා තෝරා ගන්නා ලද සැපයුම්කරුවන් සමග ගිවිසුමකට එළඹ නොතිබුණි. | 2018 ජනවාරි 27 දිනැති අංක LAE/2018/42 දරන අභ්‍යන්තර චක්‍රලේඛයේ 2.8.11 ජේදය ප්‍රකාරව ආහාර සැපයීම සඳහා තෝරා ගන්නා ලද සැපයුම්කරුවන් සමග ගිවිසුමකට එළඹිය යුතු වීම. | නිරීක්ෂණය හා එකඟ වෙමි. ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. |
| (x) | මැතිවරණ කොමිෂන් සභාව විසින් 2018 පෙබරවාරි 10 දින පැවැත් වූ පළාත් පාලන ආයතන ඡන්දය විමසීම සඳහා භාවිතා කිරීමට ටැබ් යන්ත්‍ර 55ක් මිල දී ගැනීම සඳහා 2018 ජනවාරි 25 දින ආයතන 06කින් මිල ගණන් කැඳවා තිබුණු අතර එහිදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.2 පරිදි ලංසු පිළියෙල කිරීම සඳහා ලංසුකරුවන්ට ප්‍රමාණවත් කාලයක් ලබා දී නොතිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.2(ඇ) පරිදි ලංසු පිළියෙල කිරීම සඳහා සාධාරණ කාලයක් ලබා දිය යුතු වීම. | නිරීක්ෂණය හා එකඟ වෙමි. නිවැරදිව කටයුතු කිරීමට උපදෙස් ලබා දී ඇත. |

**3.9 වත්කම් කළමනාකරණය**

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | මහනුවර දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය විසින් ඡන්දය දින තම කාර්යාලයේ භාවිතය සඳහා මිලදී ගත් ආරෝපිත විදුලි බුබුළු 800න් 64ක් ඡන්ද නිකුත් කිරීමේ මධ්‍යස්ථාන වෙත නිකුත් නොකර ගබඩා කර තිබුණි. | මුදල් රෙගුලාසි 762 ප්‍රකාරව පමණට වඩා අධික තොග ගබඩාවේ තබා නොගැනීමට සැලකිලිමත් විය යුතු වීම. | හදිසි අවශ්‍යතා හා විදුලිබල මණ්ඩලයේ නිර්දේශ මත මිල දී ගෙන ඇත. 2019 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. |
| (ආ) | කොළඹ දිස්ත්‍රික් මැතිවරණ | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ | එම අවස්ථාවේ කොළඹ දිස්ත්‍රික් |

| | | |
|---|---|---|
| කාර්යාලයේ භාවිතය සඳහා 2012 දෙසැම්බර් 29 දින රු.437,000ක මුදලකට මිල දී ගත් යකඩ රාක්ක මාස 08 ක් එම දිස්ත්‍රික් කාර්යාලය වෙත භාර දීමකින් තොරව ප්‍රධාන කාර්යාලයේ ගබඩාව තුල නිෂ්ක්‍රීයව පැවතුණි. | සංග්‍රහයේ 1.2.1.(අ) ප්‍රකාරව නිසි කලට වේලාවට ප්‍රසම්පාදන කටයුතු කරන බවට සහතික විය යුතු වීම. | මැතිවරණ කාර්යාලයේ ප්‍රමාණවත් ඉඩකඩ නොතිබීම හේතුවෙන් එම කාර්යාලය නව ගොඩනැගිල්ලකට යන තෙක් ප්‍රධාන කාර්යාලයේ ගබඩාව තුල රඳවා තබා ගන්නා ලදී. 2019 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. |

**3.10 කළමනාකරණ දුර්වලතා**

----------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | <u>විගණන නිරීක්ෂණය</u> | <u>නිර්දේශය</u> | <u>ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම</u> |
|---|---|---|---|
| (අ) | 2018 පළාත් පාලන ආයතන ඡන්ද විමසීමට අදාලව කොළඹ දිස්ත්‍රික් ප්‍රවාහන කමිටුව වෙත නිකුත් කරන ලද රු.20,000 ක අතුරු අග්‍රිමය එම කමිටුව විසින් ලබා ගෙන නොතිබුණු අතර එම මුදල මාස 04 ක් බැංකුගත නොකර ආයතනයේ රදවාගෙන තිබුණි. | විධිමත් අභ්‍යන්තර පාලන පද්ධතියක් තුලින් අත්තිකාරම් නිකුත් කිරීම හා පියවීම් සම්බන්ධයෙන් පාලනයක් පවත්වා ගත යුතු වීම. | නිරීක්ෂණය හා එකග වෙමි.මින් ඉදිරියට මෙවැනි කටයුතු කිරීමෙන් වලකින ලෙස උපදෙස් ලබා දී ඇත. |
| (ආ) | කොමිෂන් සභාව විසින් 2017 වර්ෂයේදී අපහරණය කිරීමට සුදුසු යැයි හඳුනාගත් වාහන 02 සඳහා අපහරණය කමිටු වේ නිර්දේශ ලබා ගැනීමට පමණක් මාස 08 ක් ගත වී තිබුණි. | 2015 ජුලි 10 දිනැති අංක 02/2015 දරන මුදල් චක්‍රලේඛයේ 12 පරිශිෂ්ඨය පරිදි සෑම වසරකට වරක්ම මෙම චක්‍ර ලේඛය ප්‍රකාරව අපහරණ ක්‍රියාවලිය සිදු කළ යුතු අතර එහිදි අපහරණය කළ යුතු වාහන ඒ පිළිබද තොරතුරු අදාල වර්ෂයේ මාර්තු 31 දිනට පෙර හා අපහරණය ක්‍රියාවලිය නිම කිරීමෙන් අනතුරුව ඒ පිළිබද තොරතුරු අදාල වර්ෂයේ ජුනි 30 දිනට ප්‍රථම නියමිත ආකෘති පත්‍ර පරිදි පිළියෙල කර ඉදිරිපත් කළ යුතු වීම. | අපහරණ කමිටු නිලධාරීන් දිස්ත්‍රික්කයෙන් බැහැර දැනුවත් කිරිමේ හා පුහුණු වැඩසටහන් වලට සහභාගී වීම හා 2018 පළාත් පාලන ආයතන ඡන්ද විමසීම හේතුවෙන් නිලධාරීන් කාර්යබහුල වීම සහ තාක්ෂණික දැනුම ඇති නිලධාරියෙකු කැඳවා ගැනීමේ අපහසුතාවය හේතුවෙන් ප්‍රමාද වී ඇත.<br>2019 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. |

**4.** **තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම**

**----------------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම සඳහා මැතිවරණ කොමිෂන් සභාව විසින් සකස් කර තිබුණු උපාය මාර්ගික සැලැස්මෙහි සියළුම දිස්ත්‍රික් කාර්යාල සඳහා 2018 වර්ෂයට අදාල ක්‍රියාකාරකම් අතුළත් කර තිබුණු අතර ගම්පහ හා මහනුවර දිස්ත්‍රික් කාර්යාල විසින් සමාලෝචිත වර්ෂයේදී කාර්යයන් කිහිපයක් ඉටු කර නොතිබුණු බව නිරීක්ෂණය විය. | සැලසුම් කළ පරිදි කටයුතු කළ යුතු වීම. | 2019 වර්ෂයේදී ඉටු කිරීමට කටයුතු කරන බව දක්වා ඇත. |